ආකෘති පත්‍ර : (අංක 01)
පාර්ලිමේන්තු සැසි අංකය : 79
ආයතනයේ නම : අමාත්‍ය මණ්ඩල කාර්යාලය

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් හඳුනාගන්නා ලද දුර්වලතාවය	දුර්වලතාවය මහහරවා ගැනීමට ආයතනය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ගය/වර්තමාන තත්ත්වය
අවදානම් ලේඛනය	මේ වන විට අවදානම් ලේඛනයක් පිළියෙල කර යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලැබේ.
භාණ්ඩ සමීක්ෂණය අවසන් කර නියමිත දිනට එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබීම.	2022 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම සඳහා 2022-12-05 දින නියමිත පරිදි භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත් කරන ලදී. 2021-12-31 දින දක්වා ජනරජ ගොඩනැගිල්ලේ ස්ථාපිතව පැවති අමාත්‍ය මණ්ඩල කාර්යාලය 2022.01.03 දින සිට ලොයිඩ්ස් ගොඩනැගිල්ල වෙත ගෙන යන ලදී. එහිදී කාර්යාල කටයුතු සහ එක් එක් අංශ නැවත ස්ථාපනය කිරීමේදී ශාඛා ඉන්වෙන්ටරි නැවත යාවත්කාලීන කිරීමට සිදු විය. ඒ අනුව භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කිරීමට ප්‍රමාද වූ අතර 2023.12.18 දින වන විට අදාළ වාර්තාවන් විගණනය වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත.
භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා පිළිබඳ නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම.	එසේම ඌණතා අතිරික්තතා පිළිබඳ නිර්දේශයන් ක්‍රියාත්මක කර ඇති අතර 2022 සහ 2023 වර්ෂ දෙක සඳහාම වන අපහරණ කටයුතු ද 2024.06.19 දින වන විට අවසන් කර ඇත.
සියලුම වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබීම.	මේ වන විට කාර්යාලයීය සියලු සංචිත වාහනවල ඉදිරිපස පැහැදිලිව පෙනෙන අයුරින් රාජ්‍ය ලාංඡනය සමඟ ආයතනයේ නම භාෂාත්‍රයෙන්ම ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරමින් පවතී.
අභ්‍යන්තර විගණන වැඩසටහන පිළියෙල කර නොතිබීම.	අමාත්‍ය මණ්ඩල කාර්යාලය 2021-12-31 දින දක්වා ස්ථාපිතව තිබූ ජනරජ ගොඩනැගිල්ලේ පැවතියේ ඉතා සීමිත ඉඩ ප්‍රමාණයක් පමණි. එබැවින්, අභ්‍යන්තර විගණන නිලධාරියකු අනුයුක්ත කර ගැනීමෙන් අනතුරුව එම නිලධාරියාට ප්‍රමාණවත් කාර්යාලයීය ඉඩ පහසුකම් සැපයීම මෙන්ම විගණන කාර්ය මණ්ඩලයට අවශ්‍ය ඉඩ පහසුකම් සැපයීමද ගැටලු සහගතව පැවතුණි. මේ වන විට අමාත්‍ය මණ්ඩල කාර්යාලය කොළඹ 01, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ පිහිටි 'ලොයිඩ්ස්' ගොඩනැගිල්ලේ ස්ථාපිත කර ඇති අතර, පුරප්පාඩුව වැඩ බැලීමේ පදනම මත සම්පූර්ණ කර අභ්‍යන්තර විගණන වැඩසටහනද වර්ෂය ආරම්භයේදී පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත.

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර පවත්වා නොතිබීම.	මේ වන විට අභ්‍යන්තර විගණන නිලධාරියකු වැඩ බැලීමේ පදනම මත පත්කර ඇති අතර නිසි පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමටද පියවර ගෙන ඇත.
මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබීම.	මේ වන විට කාර්යාලයේ පුහුණුව ලැබිය යුතු සියලුම නිලධාරින්ට අවම පැය 12ක වාර්ෂික පුහුණු අවස්ථාවන් සහතික වන පරිදි මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර ඇත. අයවැය චක්‍රලේඛ 01/2023 හා 2023.01.27 දරන චක්‍රලේඛය මෙන්ම 01/2024 හා 2024.01.10 දිනැති චක්‍රලේඛය මඟින්ද පුහුණුවීම්, සේවා ව්‍යවස්ථාවල අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා පමණක් සීමා කර ඇති බැවින් පුහුණු කිරීම් කටයුතු සිදු කර නොමැත.
සමස්ත කාර්ය මණ්ඩලය ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර නොතිබීම.	මෙම කාර්යාලයේ මාණ්ඩලික ශ්‍රේණිවල සෑම නිලධාරියෙක්ම සෑම ලිත් වර්ෂයක් ආරම්භයේ දී රා.පරි.ව. 07/98 හා 08/98 හි උපදෙස් පරිදි එම වර්ෂයට අදාළ රාජකාරි සම්බන්ධ කාර්යසාධන සැලැස්ම ඉදිරිපත් කරනු ලැබේ. එම කාර්යසාධන සැලැස්ම තුළ නිලධාරින් අදාළ වර්ෂය තුළ වගකීම් දරන ක්ෂේත්‍රයන්, නිමකළ යුතු කාර්යයන් හා එයට අදාළ කාර්ය දර්ශකයන් ද ඇතුළත්වේ. එම කාර්ය සාධන සැලැස්ම සඳහා අදාළ මාණ්ඩලික නිලධාරියා, අධීක්ෂණ නිලධාරියා සහ අමාත්‍ය මණ්ඩලයේ ලේකම් හෝ ලේකම් විසින් බලය පවරන ලද ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු හෝ අත්සන් තබන අතර ඒ අනුව එය, වාර්ෂිකව ඉටුකළ යුතු රාජකාරි වගකීම් සම්බන්ධ ගිවිසුමක් වශයෙන් ක්‍රියාත්මක වේ. එසේම එම සැලැස්මට අදාළ කාර්යසාධනය අර්ධ වාර්ෂිකව හා වාර්ෂිකව ඇගයීමට හා ප්‍රමාණනයට ලක් කෙරේ. 2018.01.24 දිනැති රා.පරි.ව. 02/2018 හි 1 ඡේදය මඟින් නියම කොට ඇති වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීමේ අවශ්‍යතාව 2023.11.30 දිනැති රා.පරි.ව. 02/2018 (I) හි 3 ඡේදය මඟින් සංශෝධනය කර ඇති අතර එම සංශෝධනය අනුව කාර්යසාධන ගිවිසුම් සකස් කිරීම තවදුරටත් අවශ්‍ය නොවන බව නිරීක්ෂණය කරමි.
හඳුනාගත් තිරසර අරමුණු ඉලක්ක ලභාකර ගැනීම මැන බැලීම සඳහා කාර්යසාධන ඉලක්ක නියම කර නොතිබුණි. හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබීම.	අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත පැවරී ඇති කාර්යභාරය සැලකීමේදී, තිරසර සංවර්ධන අරමුණු මෙම කාර්යාලයේ කාර්යයන් හා සෘජුවම සම්බන්ධ කළ නොහැක. රජයේ කටයුතු පාලනය හා මෙහෙයවීම සඳහා වන සියලුම ප්‍රතිපත්තිමය තීරණයන්ට එළඹීම සඳහා අවශ්‍ය වන සහාය ලබා දීම මෙම කාර්යාලය මඟින් සිදු කරනු ලබයි. එසේම, විවිධ අමාත්‍යාංශ විසින් ප්‍රතිපත්තිමය අනුමැතියන් ලබාගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීමේදී, ඒවායේ අන්තර්ගතය තිරසර සංවර්ධන අරමුණු හා එකඟ ද යන්න සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම ඒ සම්බන්ධයෙන් අවශ්‍ය අවස්ථාවලදී පැහැදිලි කිරීම් ලබා දීමත් මෙම කාර්යාලය මඟින් සිදු කරනු ලබයි.

උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබීම.	මෙම කාර්යාලය සාමාන්‍ය වාර්ෂික ස්ථානමාරු ක්‍රියාත්මක නොවන කාර්යාලයකි. එසේම, මෙම කාර්යාලයේ රාජකාරි ස්වභාවය අනුව සාමාන්‍ය රාජකාරි වේලාවෙන් පසුව සහ සති අන්ත හා නිවාඩු දින වලදී ද රාජකාරි කළ හැකි නිලධාරීන් විශේෂයෙන් හඳුනාගෙන එම අයගේ ආරක්ෂක නිෂ්කාශන වාර්තා ද සමාලෝචන කිරීමෙන් අනතුරුව මෙම කාර්යාලය වෙත ස්ථානමාරු කරවා ගැනීමට කටයුතු කරනු ලබයි. එවැනි නිලධාරීන් හඳුනාගැනීම තරමක් දුෂ්කර කාර්යයක් වන අතර එසේ හඳුනාගත් නිලධාරීන් දිර්ඝ කාලයක් මෙම කාර්යාලයේ සේවය කරති. එසේ දීර්ඝ කාලයක් සේවය කරන නිලධාරීන් ආයතනික දැනුමින් පිරිපුන් වන බැවින් අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ රාජකාරි සම්බන්ධයෙන් අත්දැකීම් සහිත කාර්යක්ෂම නිලධාරීන් නිරන්තරයෙන් ස්ථානමාරු කිරීම මෙම කාර්යාලයේ කාර්යසාධනය සම්බන්ධයෙන් අහිතකර බලපෑමක් ඇති කරනු ඇත. එහෙත් නිලධාරි ඉල්ලීම් හා වෙනත් මානුෂීය කාරණා මත අවශ්‍ය නිලධාරීන්ට ස්ථානමාරු ලබා දීමට අවශ්‍ය පියවර ගනු ලැබ ඇත.

ඩබ්ලිව්.එම්.ඩී.ජේ.ප්‍රනාන්දු
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්

2022/09/14

ඩබ්ලිව්.එම්.ඩී.ජේ. ප්‍රනාන්දු
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
අමාත්‍ය මණ්ඩල කාර්යාලය
ලොයිඩිස් ගොඩනැගිල්ල
ශ්‍රීමත් බාරෝන් ජයතිලක මාවත
කොළඹ 01.